NILIS

DSL 2022/2023

# පාසල් පුස්තකාලයාධිපතිත්ව ඩිප්ලෝමා පාඨමාලාව

## Diploma in School Librarianship (පාඨමාලා කේතය: DSL)

**1) හැඳින්වීම**

වර්ෂ 1998 දී හඳුන්වා දෙන ලද අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට අනුව පුස්තකාලය, ශ්‍රව්‍ය දෘශ්‍ය ඒකකය හා පරිගණක විද්‍යාගාරය එක් ඒකකයක් ලෙස සලකමින් පාසල් පුස්තකාලය, පාසල් පුස්තකාල ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථානය ලෙස නම් කරන ලදි. ඒ අනුව තොරතුරු කුසලතා ඉගැන්වීම, සහභාගීත්ව ඉගැන්වීම, ස්වාධීන ඉගෙනුමට පහසුකම් සැපයීම හා කියවීම ඉගැන්වීම ගුරු/පාසල් පුස්තකාලයාධිපතිගේ කාර්යභාරය වන අතර, මෙමඟින් සම්පත් පාදක ඉගෙනුම හා සහභාගීත්ව ඉගෙනුම මූලික කර ගනිමින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම අපේක්ෂා කෙරේ. මෙම ඩිප්ලෝමා පාඨමාලාවෙන් අපේක්ෂා කරනුයේ පාසල් පුස්තකාලය මගින් සිදු කෙරෙන උක්ත කාර්යයන් සඳහා සහාය දැක්විය හැකි වෘත්තිකයන් පිරිසක් බිහි කිරීමයි.

**2) ඉලක්ක කණ්ඩායම**

පාසල් පුස්තකාලවල සේවය කරන හෝ පාසල් පුස්තකාල කෙරෙහි උනන්දුවක් දක්වන ඕනෑම අයෙකු සඳහා.

**3) පාඨමාලාවට බඳවා ගැනීමේ සුදුසුකම්**

- අ.පො.ස (උ.පෙ.) සමත්වීම (පැරණි විෂය නිර්දේශයට අනුව ප්‍රධාන විෂයන් 04 සමත් වීම හෝ නව විෂය නිර්දේශයට අනුව ප්‍රධාන විෂයන් 03 සමත්වීම.)

  **හෝ**

- අ.පො.ස (සා.පෙ.) සමත්වීම **<u>සහ</u>** ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය මගින් පවත්වනු **පාසල් පුස්තකාලයාධිපතිත්ව සහතික පත්‍ර පාඨමාලාව (CSL) / පාසල් පුස්තකාලයාධිපතිත්ව උසස් සහතික පත්‍ර පාඨමාලාව (ACSL) / හෝ පුස්තකාලයාධිපතිත්ව උසස් සහතික පත්‍ර පාඨමාලාව** (ACL) සමත්ව තිබීම.

**4) ඉගෙනුම් ඵල**

මෙම පාඨමාලාව හැදෑරීමෙන් පසු

- පාසල් පුස්තකාලයේ නව ප්‍රවණතා අවබෝධ කර ගැනීමට
- සම්පත් පාදක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට පාසල් පුස්තකාලයේ දායකත්වය හඳුනාගැනීමට,
- අන්තර්ජාලය ඉගෙනුම් ඉගැන්වීම් මෙවලමක් ලෙස යොදා ගත හැකි ආකාරය වටහා ගැනීමට සහ
- තොරතුරු සාක්ෂරතා සහිත පුද්ගලයෙකු බවට පත්කිරීමට අවශ්‍ය නිපුණතා ලබා ගැනීමට හැකිවනු ඇත.

**5) පාඨමාලාවට අන්තර්ගත විෂයන්**

1) පාසල් පුස්තකාල ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථාන
2) තොරතුරු සාක්ෂරතාව
3) අන්තර්ජාල සාක්ෂරතාව
4) පුස්තකාල එකතු කළමනාකරණය
5) ළමා හා යොවුන් සාහිත්‍යය
6) කියවීම ඉගැන්වීම
7) ව්‍යාපෘතිය

6) **පාඨමාලාවේ වැදගත්කම:** DSL පාඨමාලාව (ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවේ - SLQF Level 3) සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් පසුව, රූපයේ දැක්වෙන පරිදි, ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය විසින් පවත්වනු ලබන උසස් ඩිප්ලෝමාව (SLQF Level 4) දක්වා ඉදිරියට යාමට හැකි වේ.




7) **පාඨමාලා කාලය :** මාස 12

8) **මාධ්‍ය :** සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි (එක් එක් මාධ්‍යයෙන් පංති පැවැත්වීම එම මාධ්‍ය සඳහා සිසුන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් ලියාපදිංචි වීම මත රඳා පවතී).

9) **පන්ති පැවැත්වීම :** නැවත දැනුම් දෙනතුරු සියලුම පන්ති මාර්ගගතව (Online) පැවැත්වේ.

10) **ඇගයීම් ක්‍රමවේදය**

- සෑම විෂයක් සඳහාම පැවරුම් ලබා දෙන අතර ලිඛිත විභාගයක් ද පැවැත්වේ. එක් එක් විෂය සඳහා 50% ක් පැවරුම් වලින්ද ඉතිරි 50% ලිඛිත විභාගයෙන් ද ලකුණු එකතු කරනු ඇත. මෙයට අදාළව ව්‍යාපෘතියද සම්පූර්ණ කළ යුතුය.

11) **පාසල් පුස්තකාලයාධිපතිත්ව ඩිප්ලෝමා සහතිකය ලබා ගැනීමට නම්.**

සියලුම විෂයන්ට (ව්‍යාපෘතියද අවම වශයෙන් C සාමාර්ථයක් ලබා ගත යුතුය. එනම් සෑම විෂයකටම අවම වශයෙන් 50% ක ලකුණු ලබා ගත යුතුය. විෂයන් තුනක් හෝ ඊට අඩු සංඛ්‍යාවකට D හෝ E සාමාර්ථ තිබුණහොත් එම විෂයන් සඳහා පමණක් පුනර් පරීක්ෂණයට පෙනී සිටිය යුතුය.

12) **පාඨමාලා ගාස්තු**

**සම්පූර්ණ පාඨමාලා ගාස්තුව රු. 27900/= කි.** එම ගාස්තුව සම්පූර්ණයෙන් හෝ, මෙහි දැක්වෙන පරිදි වාරික දෙකකින් ගෙවිය හැකිය.

| වාරිකය | මුදල | ගෙවිය යුතු දිනය |
|---|---|---|
| **පළමු වාරිකය** | රු.16,150 | පාඨමාලාවට ලියාපදිංචි වීමට පෙර ගෙවිය යුතුය |
| **දෙවන වාරිකය** | රු.11,750 | පළමු සමාසික පරීක්ෂණයට පෙර ගෙවිය යුතුය (මාස 06ක් ඇතුළත). |

13) **අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය : 2022 ජූලි 07**

14) **පාඨමාලා ආරම්භය: 2022 අගෝස්තු මස**

15) **අයදුම් කරන ආකාරය**

- අයදුම්පත්‍රය අපගේ වෙබ් අඩවියෙන් (https://nilis.cmb.ac.lk/home/news/2022/new_2022/2208/) බාගත කරන්න.
- අයදුම් පත්‍රය හැකිතාක් පැහැදිලිව පුරවන්න
- අයදුම්පත්‍ර ගාස්තු ලෙස රු. 250.00 ක මුදලක් මහජන බැංකුව තිඹිරිගස්යාය ශාඛාවේ 086100101191736 අංක දරණ ගිණුමට බැර කර මුල් ලදුපත අයදුම් පත්‍රයේ ලබා දී ඇති කොටුවේ අලවන්න.
- ජාතික හැඳුනුම්පත, උප්පැන්න සහතිකය, අ.පො.ස./උ.පෙළ සහ අ.පො.ස./සා.පෙළ සහතික යන ලේඛනවල සහතික කළ පිටපත් අමුණන්න.
- ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ පාඨමාලා කේතය ලියන්න.
- අයදුම්පත සහ අනෙකුත් ඇමුණුම් පහත ලිපිනයට තැපැල් කරන්න.


ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය
කොළඹ විශ්වවිද්‍යාලය
කොළඹ 03.